**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ගනුදෙනු පිළිබඳව විගණකාධිපති වාර්තාව - 2019**

---

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2019,2020 හා 2021 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 වත්කම් , වගකීම්, ආදායම් හා වියදම්**

---

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 7,476,170 |
| ජංගම වත්කම් | 154,219,287 |
| අනෙකුත් ජංගම වත්කම් | 561,941 |
| **මුළු වත්කම්** | **162,257,398** |

| | |
|---|---|
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 49,798,341 |
| | |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 5,919,000 |
| ජංගම බැරකම් | 106,540,060 |
| | ---------------- |
| **මුළු බැරකම්** | **162,257,401** |
| | ========= |
| | |
| මුළු ආදායම | 33,245,125 |
| මුළු වියදම | 29,599,492 |
| | -------------- |
| **අතිරික්තය** | **3,645,633** |
| | ======== |

**2.2 නීති රීති හා රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------------

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| -------------------- | ------------------ | -------------------- | --------------- |
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනත | | | |
| (i) 13(ආ) | විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීමට කටයුතු කර නොතිබුණි. | Business Delegation යන වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින් විදේශ තාක්ෂණය රටට ගෙන ඒමටත් දේශිය ව්‍යවසායකයා ජාත්‍යන්තරයට ගෙනයාමටත් ක්‍රියාකරන ලදී. | දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම යන අරමුණ ඉටු කරගැනීමට ක්‍රියා කල යුතුය. |
| (ii) 13(උ) | තාක්ෂණික දියුණුව , නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | තාක්ෂණික සංවර්ධන අරමුදල ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන ජර්මානු ව්‍යාපෘතිය (giz) හා එක්ව කටයුතු කිරීමේදී එම ආයතනය විශාල මුදලක් ඉල්ලා සිටි බැවින් අධ්‍යක්ෂක මණ්ඩලයට | පනතේ අරමුණු ඉටු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | (එවකට සිටි ) හා අමාත්‍යාංශයට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා අනුමැතියක් නොලැබුනු නිසා එම අරමුදල පිහිටුවීමට නොහැකිවිය. | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103 හා 104 | | | |
| | අධිකාරිය සතුව තිබූ රු.203,890 ක් වටිනා ලැප්ටොප් පරිඝණක දෙකක් හා රු.61,900 ක් වටිනා ටැබ් පරිඝණක යන්ත්‍ර දෙකක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අධිකාරියට අයත් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර දෙකක් 2015 වර්ෂයේදී හා 2017 වර්ෂයේදී ද ටැබ් පරිගණක දෙකක් 2019 වර්ෂයේදී ද අස්ථාන ගත වී ඇති අතර ඒ සම්බන්ධව මේ වන විට මූලික විමර්ශනයක් 2020/09/09 අසන්න දිනවල පවත්වා වැඩි දුර පරීක්ෂණ සඳහා කළමනාකාරිත්වයේ උපදෙස් මත නාරාහේන්පිට පොලිසියේ පැමිණිල්ලක් යොදා ඇත. මෙහි පොලිස් වාර්තාව මේ වන විටත් ලැබී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවත් අධිකාරිය විසින් 2019 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | බැංකු සැසඳුම් පිළියෙළ කිරීම පැවති සේවක ගැටළුව හා පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැති නිසා ඒ ඒ අදාල මාසවල සිදුකිරීම ප්‍රමාද විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 507 හා 756 | දෙසැම්බර් මස 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් කර වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2017 , 2018 හා 2019 වර්ෂ සඳහා මෙම වාර්තාවේ දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | ආයතනය විවිධ ස්ථානවලට මාරුවීම (දැනට කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේම) නිසා 2017, 2018 හා 2019 යන වසරවල භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට නොහැකි විය. නමුත් මේ වන විට 2020 වසරේ සිට භාණ්ඩ සමීක්ෂණය පවත්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (iv) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක් වූ මුද්දර ගාස්තු අයකල යුතු වුවද අවස්ථා 72 දී රු. 7,325,000 ක ගෙවීම් වලට අදාලව මුද්දර ගාස්තු අඩුකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදීම් නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක් වූ මුද්දර ගාස්තු අයකල යුතුය. |

## 2.3 අත්තිකාරම් පාලනය

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ----------------- |
| (අ) | ලබා දුන් අත්තිකාරම් මුදලෙන් සියයට 30 ට වඩා වැඩි ප්‍රමාණයක් ඉතිරි වූ අවස්ථා 40ක් නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු.740,195 ක් විය.එය නිකුත් කල අත්තිකාරම් මුදල් ප්‍රමාණයෙන් සියයට 47 ක් වී තිබුණි. | මෙම අත්තිකාරම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා කරනු ලබන වැඩසටහන් සඳහා ලබාදී තිබුණු අතර. ඔවුන් විසින් දෙනුලබන අයවැය වියදම පදනම් කරගෙන අදාල මුදල් නිදහස් කරනු ලැබේ.<br>අප විසින් උපදෙස් ලබාදී ඇත්තේ සැමවිටම වියදමට අදාලව අවශ්‍ය මුදල් අත්තිකාරම් වශයෙන් ලබාගන්නා ලෙසටය. | වියදම නිවැරදිව ඇස්තමේන්තු කර අත්තිකාරම් ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලබා දුන් අත්තිකාරම් මුදල් වැය නොකර දින 03 සිට දින 281 දක්වා කාලයක් රඳවාගෙන සිට සම්පූර්ණ මුදලම පියවා තිබුණු අවස්ථා 21 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු.685,960 ක් වී තිබුණි. | අත්තිකාරම් මුදල් පාලනය සම්බන්ධ මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | කාර්යන් නිසිපරිදි සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර ක්‍රියාත්මක නොවන කාර්යන් වෙනුවෙන් නිකුත් කළ අත්තිකාරම් නොපමාව අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3. 1 සැලසුම් කිරීම

---------------

සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය පහත සඳහන් පරිදි විය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------- | ---------------- |
| (අ) | ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකයින්ගේ දායකත්වය ඇගයීමට ප්‍රාදේශීය ව්‍යවසාය සම්මාන උළෙල 9ක් හා ජාතික ව්‍යවසාය සම්මාන උළෙලක් පැවැත්වීම සඳහා රු.8,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.6,020,000 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, පළාත් 05 ක පමණක් සම්මාන උළෙලවල් පවත්වා තිබූ අතර ජාතික ව්‍යවසාය සම්මාන උළෙල 2019 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වා නොතිබුණි. | අධිකාරිය වෙත ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම මත හා වර්ෂ අවසානයේදී ප්‍රතිපාදන ලැබුණු හෙයින් පළාත් පහක පමණක් සම්මාන උළෙලවල් පැවැත්වීමට සිදු විය. ප්‍රාදේශීය සම්මාන උළෙලයන් මගින් ජයග්‍රහනය කළ ව්‍යවසායන් අතරින් ජාතික මට්ටමේ සම්මාන උළෙලක් පැවැත්වීමට අධිකාරිය සැලසුම් කළ නමුදු ප්‍රාදේශීය සම්මාන උළෙලයන් වර්ෂය අවසානයේදී පැවැත්වූ හෙයින් එම ප්‍රාදේශීය සම්මාන උළෙලයනහි ජයග්‍රාහී ව්‍යවසායක නාම ලේඛන ලබාගැනීමට ප්‍රමාද විය. එබැවින් ජාතික මට්ටමේ සම්මාන උළෙලක් පැවැත්වීමට අධිකාරියට නොහැකි විය. | ප්‍රතිපාදනයන් කලින් ඉල්ලුම් කර සැලසුම් කර තිබූ කාර්යයන් ඉටු කර ගැනීමට ක්‍රියා කල යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපාර දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.1,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ක්ෂුද්‍ර සුළු හා | ටැබ් යන්ත්‍ර භාවිතා කර කෙටි කාලයකදී විවිධ දෝෂ වාර්තා වූ හෙයින් සියළු යන්ත්‍ර නිසි පරික්ෂාවට ලක් කර දෝෂ | සැලසුම් කර තිබූ කාර්යයන් ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම හා එම පද්ධතිය තුළින් ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම අපේක්ෂාකර තිබුණු අතර පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පරිගණක මිලදී ගෙන බෙදා දීමේ උත්සවය සඳහා රු.120,000 ක් වියදම් කර තිබුණි. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපාර දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | නිරාකරණය කර ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව සියළුම ටැබ් යන්ත්‍ර ආපසු ලබා ගෙන එම දෝෂ හඳුනාගෙන සැපයුම් ආයතනය හරහා නැවත අළුත්වැඩියා කර නැවත ලබා දීමට කටයුතු කල අතර මේ සඳහා වැඩි කාලයක් ගත වූ හෙයින් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලබා දීමට නොහැකි විය. | |
| (ඇ) | ISO සහතිකය ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේ රු.71,762 ක් ද 2017 වර්ෂයේ රු.125,000 ක්ද 2018 වර්ෂයේ රු.35,880 ක්ද වශයෙන් එකතුව රු.232,642 ක මුදලක් වැයකර තිබුණි. තවද, 2019 වර්ෂයේදී ද ISO සහතිකය ලබා ගැනීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණද ISO සහතිකය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වැඩසටහන තුළින් ISO සහතිකය ලබාගත නොහැකි වූවද ආයතනයේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා නිසි ආයතනික ප්‍රතිපත්ති සහ ක්‍රමවේද ආයතනය තුළ ඇති විය. | සැලසුම් කර තිබූ කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඈ) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම අනුව තරුණ ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත රු.1,140,000 ක මුදලක් ලබා දී තිබුණද, වර්ෂය තුළ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | මෙම වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත මුදලින් අත්තිකාරම් මුදලක් වශයෙන් (20%) රු.මි. 1.14ක මුදලක් පමණක් අධිකාරියට ලැබුණි. අධිකාරිය මගින් වෘතීය පුහුණු ලාභීන් 100 දෙනෙකු පුහුණු කිරීමට හැකියාව ලැබුණු අතර ඔවුන්ට අදාල යන්ත්‍රෝපකරණ වලින් කොටසක් පමණක් ප්‍රසම්පාදන ක්‍රමවේද ඔස්සේ මිලදී ගැනීමට හැකියාව ලැබුණි. | සැලසුම් කර තිබූ කාර්යයන් ඉටු කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අධිකාරිය මඟින් Know How වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දුන් අත්තිකාරම් මුදල ඉක්මවා රු.2,605,147 ක් 2019 වර්ෂයේදී වැයකර තිබුණද වැඩිපුර දරන මුදල ප්‍රතිපූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි මුදල අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට ලිඛිතව අමාත්‍යාංශය වෙත දැනුවත් කලද එම මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට හැකියාව නොලැබුණි. | අධිකාරිය වෙත ප්‍රතිපූරණය කරගත යුතු මුදල් නොපමාව ප්‍රතිපූරණය කරගත යුතුය. |